**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**University of Sri Jayewardenepura**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

**External Degrees and Extension Courses Unit**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/EEX-05/2025 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 0113-485402 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | exams.edecu@sjp.ac.lk |


2025-02-19

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි

**<u>පුනර් අපේක්ෂකයින් සඳහා විභාග අයදුම්පත් කැඳවීම - 2025</u>**

**<u>වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (නව විෂය නිර්දේශය)</u>**
**<u>2017/2018/2019/2020/2021 කණ්ඩායම් සඳහා</u>**

**01**. ඉහත පුනර් පරීක්ෂණයට අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීමට පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

02.

| | |
|---|---|
| පුනර් පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk/B.com (General) External Degree/Examination/Applications වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කරගත හැක. |
| **පුනර් පරීක්ෂණ ගාස්තු** | විෂයයන් 1ක් සඳහා රු. 5,000.00<br>විෂයයන් 2ක් සඳහා රු. 7,000.00<br>විෂයයන් 3ක් සඳහා රු. 9,000.00<br>විෂයයන් 4ක් සඳහා රු. 11,000.00<br>විෂයයන් 5ක් සඳහා රු. 13,000.00<br>විෂයයන් 6ක් සඳහා රු. 15000.00 |
| 2024 අගෝස්තු පවත්වන ලද උපාධි II පරීක්ෂණයට අයදුම් කර වෛද්‍ය හේතු මත විභාගයට වරප්‍රසාද ලැබූ 2021 වර්ෂයේ ලියාපදිංචි අපේක්ෂකයන්ද පරීක්ෂණ ගාස්තු ගෙවීම අනිවාර්ය වේ. | |
| <u>අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය</u><br><br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ | නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවන ලද රිසිට් පතෙහි ස්කෑන් පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර exams.edecu@sjp.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර (එසේ යොමු කිරීමේදී විද්‍යුත් ලිපියෙහි විෂයය (Subject) ලෙස ඔබගේ විභාග අංකය සහ පරීක්ෂණයෙහි නම යොදන්න උදා. 201500001-B.Com Part -2 Examination), අංක 16, එස්.ඩී.එස්. ජයසිංහ මාවත ලිපිනයෙහි පිහිටි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ගෙනවිත් භාරදීම හෝ මෙහි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම කළ යුතුයි. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ. |
| අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය | **2025 මාර්තු 06** |

03.

<table>
<tr><th><u>ලියාපදිංචිය දීර්ඝ කිරීම</u></th><th></th></tr>
<tr><td>2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-09-30 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 4 ක් අළුත් කර තිබිය යුතුය)</td><td rowspan="4">ලියාපදිංචිය දීර්ඝ කිරිමට අදාළ තොරතුරු external.sjp.ac.lk/B.Com (General) External Degree/Registration/Renewal වෙත පිවිස ලබාගත හැක.අදාළ ගාස්තු ගෙවීමෙන් අනතුරුව අයදුම්පතෙහි සහ රිසිට්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් <u>exams.edecu@sjp.ac.lk</u> විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර (එසේ යොමු කිරීමේදී විද්‍යුත් ලිපියෙහි විෂයය (Subject) ලෙස ඔබගේ විභාග අංකය සහ Registration Renewal ලෙස යොදන්න. උදා.201500300-Registration Renewal), සතියේ දිනක කාර්යාල වේලාවන්හිදි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට පැමිණ ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය.</td></tr>
<tr><td>2018 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-09-30 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 3 ක් අළුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2019 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 2 ක් අළුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය එක්වරක් අළුත් කර තිබිය යුතුය)</td></tr>
</table>

**සැලකිය යුතුයි**

I. **2017 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන් හට උපාධි 2 පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි අවසන් අවස්ථාව මෙය වේ .**

II. <u>පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරිකය ද ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තුද සම්පුර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2025/03/06** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. ගාස්තු ගෙවීම, දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් සිදුකළ හැක. (එහි ඡායා පිටපතක් ළග තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිළිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද අසම්පුර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරිම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **<u>http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/</u>** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පු**ර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර external.sjp.ac.lk/ B.Com (General) External Degree/Examinations/Admission Card වෙත පිවිස ඔබගේ ජාතික හැදුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.**

IX. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/B.Com (General) External Degree/ Examinations/ Rules and Regulations** වෙත පිවිස පරිශීලනය කල හැක.

X. **උපාධියක් සම්පූර්ණ කිරීම :** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබද විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ශිෂ්‍ය විවරණිකාව (Prospect ) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.



ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-02-19